People’s Action for Free & fair Election (PAFFREL)

| **වංචා , අපහරණ සහ හානි පිළිබඳ ප්‍රතිපත්තිය** | **ප්‍රතිපත්ති අංකය:** |
|---|---|
| අනුමත කළේ : අධ්‍යක්ෂ මණ්ඩලය | |
| අනුමත කළ දිනය: | |
| සමාලෝචනය/ පසුවිපරම් සිදු කරන දිනය: වසර 3කට වරක් හෝ ඕනෑම මොහොතක | |
| භාෂා මධ්‍යය: සිංහල / දෙමළ / ඉංග්‍රීසි | |
| අදාළ පුද්ගලයන්/ පාර්ශවයන්: පැෆ්රල් කාර්ය මණ්ඩලයට ඍජුව හෝ වක්‍රව සම්බන්ධ වන පිරිස් | |

## 1. ප්‍රතිපත්ති ප්‍රකාශය

වංචා සහ හානි බැරෑරුම් ලෙස සැලකීම පැෆ්රල් සංවිධානයේ ප්‍රතිපත්තියයි. කිසියම් වංචාවක් හෝ හානියක් (අලාභයක්) සිදු කරන හෝ සිදු කර තිබෙන බවට සැකයක් ඇති වූ විට, කාර්ය මණ්ඩලය විසින් ඒ පිළිබඳව හැකි ඉක්මනින් වාර්තා කළ යුතුය; ඊට සම්බන්ධ සැකකරු ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වයේ සාමාජිකයෙක් නම් එම වාර්තාව විධායක අධ්‍යක්ෂ වෙත යොමු කළ යුතුය.

සෙසු සේවකයින් විසින් සිදු කරන වංචා හා පාඩු පිළිබඳ වාර්තා පරිපාලන නිලධාරියා වෙත යොමු කළ යුතුය.

කෙසේ වෙතත්, එසේ වාර්තා කරනු ලබන සියලුම වංචා හා පාඩු පිළිබඳ වාර්තා පරිපාලන නිලධාරියා විසින් පවත්වාගෙන යනු ලබන පැෆරල් සංවිධානයේ වංචා සහ පාඩු පිළිබඳ ලේඛනයේ සටහන් කරණු ලැබේ.

සියලුම පැෆ්රල් සේවකයින් සහ වැඩසටහන් හවුල්කරුවන් වංචා හා දූෂණ පාලනය සඳහා වගකිව යුතු අතර ඒ සම්බන්ධයෙන් ඔවුන් විසින් ඉටු කළ යුතු කාර්ය භාරයක් තිබේ. සත්‍ය හෝ සැක කටයුතු වංචනික ක්‍රියා හෙළිදරව් කිරීම කෙරෙහි යොමු වූ ධනාත්මක සංස්කෘතියක් ආයතනය තුළ ගොඩනැගීම සඳහා පැෆ්රල් සංවිධානය විසින් සියළුම කාර්ය මණ්ඩල සාමාජිකයින් / සාමාජිකාවන් දිරිමත් කරනු ලැබේ. එසේ කිරීම මේ සම්බන්ධයෙන් ගත යුතු සුදුසු ක්‍රියාමාගර්ය වන අතර, ආයතනය වෙත යොමු කෙරෙන වංචනික ක්‍රියාකාරකම් පිළිබඳ සියළුම වාර්තා පැෆරල් සංවිධානය විසින් හොඳින් විමර්ශනය කරන අතර එවැනි වංචනික ක්‍රියා වාර්තා කරන හැම කෙනෙකුගේම නිර්නාමිකභාවය පැෆ්රල් සංවිධානය විසින් ආරක්ෂා කරනු ඇත.

මේ සම්බන්ධයෙන් පැෆ්රල් සංවිධානය වංචා හා පාඩු සිදුවීම් හැකි තාක් දුරට වැළැක්වීම සඳහා සහ එවැනි සිදුවීම් ඇති වූ විට ඒවායේ බලපෑම අවම කිරීමේ අරමුණ පෙරදැරි කරගෙන ප්‍රමාණානුකූලභාවය හා අවදානම පදනම් කරගත් (proportionate and risk-based approach) ප්‍රවේශයක් අනුගමනය කරනු ලැබේ. එමගින් ආයතනයේ අරමුදල් සහ වත්කම් වංචා කිරීම් හා පාඩු සිදුවීම්වලින් ආරක්ෂා වන බවට සාධාරණ සහතිකයක් ලබා දීමට කළමනාකාරිත්වයට ඉඩ සලසයි.

## 2. නීත්‍යානුකූලභාවය

පැෆ්රල් සංවිධානය ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන අදාළ සියළුම නීතිවලට අනුකූලව ක්‍රියා කරනු ලැබේ. මෙම ලේඛනයේ අඩංගු පැෆ්රල් ප්‍රතිපත්ති ශ්‍රී ලංකාවේ බල පැවැත්වෙන නීතියටත් වඩා දැඩිව ක්‍රියාත්මක කරනු ලැබේ .

## 3. අවදානම් ප්‍රකාශය

පැෆ්රල් සංවිධානය සිය කාර්ය මණ්ඩලය සහ හවුල්කරුවන් වංචනික ක්‍රියාකාරකම්වල නිරතවීම වැළැක්වීම සහ /හෝ පාඩු සීමා කිරීම සඳහා අවශ්‍ය ක්‍රියා පටිපාටි සහ යාන්ත්‍රණ සැලසුම් කර ඇත.

## 4. ක්‍රියා පටිපාටි

**විමශර්නය කිරීම හා වාර්තා කිරීම**

කිසියම් වංචාවක් හෝ අලාභයක් සිදුවන්නේ යැයි සැකයක් ඇතිවූ විට කාර්ය මණ්ඩලය ඒ ගැන හැකි ඉක්මනින් ආයතනයට වාර්තා කළ යුතුය. වංචා හා පාඩු ලෙස වර්ගීකරණය කරණු ලබන සිදුවීම් පිළිබඳ වාර්තා ස්වයංක්‍රීයව/ ක්ෂණිකව පරිපාලන නිලධාරියා වෙත යොමු කෙරේ. එකී සියලු වාර්තා රහසිගතව කළමනාකරණය කරන අතර එම තොරතුරු තවදුරටත් වෙනත් පාර්ශවයකට ලබාදෙන්නේ නම් එය සිදුකරනු ලබන්නේ තොරතුරු දැන ගැනීමේ දැඩි අවශ්‍යතාවය මත (on a need to know basis) පමණක් වේ.

වංචා හා අලාභ පිළිබඳ පැමිණිලි , එම සිදුවීම්වලින් සති දෙකක කාලයක් තුළ වාර්තා කළ යුතුය. එවැනි වංචාවක් හෝ අලාභයක් සිදුවී ඇතැ'යි සැක කිරීමට පැෆ්රල් සංවිධානයට සාධාරණ හේතු තිබේ නම්, එවැනි "බරපතල සිදුවීම්" වහාම අධ්‍යක්‍ෂක මණ්ඩලයට වාර්තා කළ යුතුය.

කිසියම් කායර්මණ්ඩල සාමාජිකයෙකු මෙම ප්‍රතිපත්තිවලට අනුකූලව ක්‍රියා නොකරන්නේ නම් ඒ පිළිබඳව පරිපාලන නිලධාරී සහ විධායක අධ්‍යක්ෂ සමඟ සාකච්ඡා කිරීමෙන් පසු රේඛීය කළමනාකරණය (line management) හරහා ඔහුට හෝ ඇයට එරෙහිව පියවර ගනු ඇත. ඒ සම්බන්ධයෙන් බාහිර නීතිමය ක්‍රියාමාර්ග ගනු ලබන අතර, ඒ හේතුවෙන් අදාළ කාර්ය මණ්ඩල සාමාජිකයාට (සාමාජිකයින්ට) හෝ ස්වේච්ඡා සේවකයාට

(සේවකයන්ට) හෝ සාමාජික සංවිධානයට (සංවිධානවලට) එහි ප්‍රතිඵල ලෙස නඩු පැවරීම, දඩ නියම කිරීම හෝ සිර දඬුවම් නියම විය හැක.

වංචා හා පාඩු පිළිබඳව පැෆ්රල් සංවිධානය තුළ පසුවිපරම් කටයුතු කිරීම පරිපාලන නිලධාරියාගේ වගකීම වේ.කෙසේ වෙතත්, එම පැමිණිලි මූල්‍යා නිලධාරියා සහ විධායක අධ්‍යක්ෂ විසින් අධ්‍යක්ෂ මණ්ඩලයේ උපදෙස් මත පත් කරන ලද කමිටුවක් මගින් විමර්ශනය කරනු ලබයි. එම කමිටුව සිය නිර්දේශ හා නිගමන විධායක අධ්‍යක්ෂ හරහා කළමනාකරණ කමිටුවට (සභාපති, විධායක අධ්‍යක්ෂ , භාණ්ඩාගාරික, ලේකම්) ඉදිරිපත් කළ යුතුය.

පැෆ්රල් සංවිධානයේ හවුල්කරුවන් හෝ ප්‍රජාවන් විසින් ආයතනයේ අරමුදල් සම්බන්ධයෙන් කරනු ලබන වංචා හා පාඩු පිළිබඳ පසුවිපරම් කිරීම මුදල් නිලධාරියාගේ පූර්ණ අධීක්ෂණය යටතේ අදාළ කාර්ය මණ්ඩලයේ සහ කළමනාකරුවන්ගේ වගකීම වේ. කෙසේ වෙතත්, ඒ සඳහා පරිපාලන නිලධාරියාගේ හෝ විධායක අධ්‍යක්ෂවරයාගේ සහයෝගය සහ මඟ පෙන්වීම ලබා දෙනු ඇත. සෑම පැමිණිල්ලක්ම අවසන් වීමට පෙර විධායක අධ්‍යක්ෂක විසින් අත්සන් කළ යුතුය.

පැෆ්රල් සංවිධානයේ බැඳියාවන් (interests) ආරක්‍ෂා කිරීමේ අරමුණින් සැකයට පාත්‍ර වන වංචනික සිදුවීම් ස්වාධීන හා වෘත්තීයමය ආකාරයෙන් විමර්ශනය කෙරේ. එම සිදුවීම් පැහැදිලි ලෙස ඔප්පු වෙන තුරු සැකයට පාත්‍ර වන පුද්ගලයා ( පුද්ගලයින්) වරදකරුවන් ලෙස නොසැලකේ.

එක් එක් සිද්ධිය අනුව පරීක්ෂණ ක්‍රියාවලිය වෙනස් වේ. මූලික පරීක්‍ෂණවලදී සැක කිරීමට සාධාරණ හේතු පවතින බව පෙනී යන්නේ නම් ඒ සම්බන්ධයෙන් පැවැත්වෙන පරීක්ෂණ කටයුතු පහසුවීම සඳහා චෝදනාව එල්ල වී ඇති සේවකයාගේ සේවය අත්හිටුවීම සුදුසු ය. එම තීරණය ගනු ලබන්නේ අධ්‍යක්ෂ මණ්ඩලයේ එකඟත්වයෙන් විධායක අධ්‍යක්ෂවරයා විසිනි. එවැනි සේවය අත්හිටුවීමක් විනය ක්‍රියාමාර්ගයක් ලෙස නොසැලකිය යුතුය; එමෙන්ම අදාළ සේවකයා අනිවාර්යයෙන්ම වරදක් කර ඇතැ'යි ඉන් අදහස් නොකෙරේ. ඒ පිළිබඳව සම්මුඛව කෙරෙන සියලු පරීක්ෂණ සාධාරණ හා විධිමත් ලෙස පවත්වනු ලැබේ

**<u>පාඩු අයකර ගැනීමට කටයුතු කිරීම</u>**

පැෆ්රල් සංවිධානය වංචා, සොරකම් හෝ වැරදි චර්යාවන් (අවචර්යා) නිසා සිදු වන පාඩු අයකර ගැනීම සඳහා අවශ්‍ය නම්, නීතිමය පියවර ද ඇතුළුව සුදුසු පියවර ගනු ඇත. වංචාවට සම්බන්ධ තෙවන පාර්ශවයන්ට එරෙහිව හෝ වංචාවට හා/හෝ පාඩුවට වගකිව යුතු පුද්ගලයන්ගේ නොසැලකිලිමත් ක්‍රියාවන් මීට ඇතුළත් වේ .

**<u>හවුල්කාර සංවිධාන තුළ සිදුවන වංචා:</u>**

පැෆ්රල් සංවිධානය සමග කටයුතු කරන හවුල්කාර සංවිධාන තුළ වංචා සිදුවීම වැළැක්වීමට සහ ඔවුන්ගේ ගැටලු පැෆ්රල් සංවිධානයට වාර්තා කිරීම සඳහා විශ්වාසයක් ඇති කිරීම පිණිස ඔවුන් දිරිමත් කිරීම වැදගත් වේ. එසේ කිරීමේ එක් ක්‍රමයක් නම් වංචා සම්බන්ධයෙන් ඔවුන් අනුගමනය කරන ප්‍රතිපත්තිය පිළිබඳව සහ ඒ සම්බන්ධයෙන් ඔවුන්ට ලිඛිත ක්‍රියා පටිපාටියක් තිබේද යන්න සාකච්ඡා කිරීමය. අවශ්‍ය නම් හවුල්කරුවන්ට මේ සම්බන්ධයෙන් තමන්ගේම ප්‍රතිපත්තියක් හා ක්‍රියා පටිපාටියක් සකස් කර ගැනීමට සහයෝගය ලබා දීම හිතකරය .

කිසියම් හවුල්කාර ආයතනයක වංචාවක් සිදුවී ඇති බවට සැක කිරීමට සාධාරණ හේතු තිබේ නම්, එයට ලබා දෙන ප්‍රදානයන් (grant payments) අත්හිටුවීම සුදුසු විය හැකිය.ඒ පිළිබඳ තීරණය කිරීම වැඩ සටහන් අධ්‍යක්ෂ සහ අනෙකුත් අදාළ නිලධාරීන්ගේ සහභාගිත්වය ඇතිව විධායක අධ්‍යක්ෂ විසින් ගනු ඇත. එවැනි අත්හිටුවීම් පූර්වාරක්ෂක පියවරක් පමණක් වන අතර අවශ්‍යයෙන්ම එය අදාළ ආයතනයේ වරදක් නිසා ගනු ලැබූ තීරණයක් ලෙස අදහස් නොකෙරේ.

## ප්‍රතිචාර

තහවුරු කරන ලද වංචාවක් හෝ පාඩුවක් සම්බන්ධයෙන් පැෆ්රල් සංවිධානය විසින් පහත දැක්වෙන පියවර ගනු ඇත:

- ප්‍රතිපත්ති ප්‍රකාශනයේ ඇති අඩු පාඩු හා හිඩැස් ඉවත් කර එය ශක්තිමත් කිරීම සඳහා ප්‍රතිපත්ති ප්‍රකාශනය සමාලෝචනය කිරීම සහ සංශෝධනය කිරීම;
- තහවුරු වූ සෑම සිදුවීමකින් පසු අභ්‍යන්තර සංවරණ හා තුලන ක්‍රමවේද සමාලෝචනය කිරීම;
- රක්ෂණ ක්‍රමයක් පවත්වා ගැනීම.
- අවශ්‍ය අවස්ථාවලදී අරමුදල් සපයන ආයතනයට (funding agency)වාර්තා කිරීම.

## 5. ප්‍රතිපත්තිය පිළිබඳව දැනුවත් කිරීම සහ පුහුණුව

වංචා හා පාඩු පිළිබඳ ප්‍රතිපත්තිය පිළිබඳව කාර්ය මණ්ඩලයේ සියල්ලන්ම ආයතනයේ සේවයට සම්බන්ධවන මොහොතේ පටන් දැනුවත් කරනු ඇත. එමෙන්ම, කාර්ය මණ්ඩලය විසින් අනෙකුත් නියෝජිතයින්, හවුල්කරුවන් හෝ සැපයුම්කරුවන් සමඟ ගිවිසුම්වලට එළඹීමේදී වංචා හා පාඩු පිළිබඳ ප්‍රතිපත්තිය පිළිබඳව ඔවුන් දැනුවත් කළ යුතුය.

## 6. අදාළ ප්‍රතිපත්ති, ක්‍රියා පටිපාටි, ආකෘති පත්‍ර, මාර්ගෝපදේශන සහ වෙනත් සම්පත්

මෙම ප්‍රතිපත්ති ප්‍රකාශනය භාවිතා කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා පහත දැක්වෙන ප්‍රතිපත්ති, ක්‍රියා පටිපාටි, ආකෘති පත්‍ර, මාර්ගෝපදේශ සහ අනෙකුත් සම්පත් උපකාරී වනු ඇත:

**ප්‍රතිපත්ති:** ආචාර ධර්ම පද්ධතිය , මුදල් අත්පොත

- ෆෝමර් /ආකෘති

## 7. අභ්‍යන්තර විගණනය:

සංවිධානයේ අවදානම් කළමනාකරණය, පරිපාලනය සහ අභ්‍යන්තර පාලන ක්‍රියාවලීන් කාර්යක්ෂමව ක්‍රියාත්මක වන බවට අභ්‍යන්තර විගණකවරයෙකු විසින් විටින් විට ස්වාධීන සහතිකයක් ලබාදීමෙන් තහවුරු කළ යුතුවේ. එසේ අවදානම් කළමනාකරණය, පරිපාලනය සහ අභ්‍යන්තර පාලන ක්‍රියාවලීන්වල කාර්යක්ෂමතාව ඇගයීම හා වැඩිදියුණු කිරීම සඳහා විධිමත් හා විනයගරුක ප්‍රවේශයක් ආයතනය තුළ ක්‍රියාත්මක වන බව සහතික කිරීම පැෆ්රල් සංවිධානයේ අරමුණු ඉටු කර ගැනීමට උපකාරී වේ. අභ්‍යන්තර විගණනය මගින් දත්ත සහ පරිපාලන ක්‍රියාවලීන් විග්‍රහ කිරීම හා විශ්ලේෂණය කිරීම මත පදනම්ව, අවශ්‍ය තොරතුරු හා නිර්දේශ ලබා දීමෙන් මෙම පරමාර්ථ සාක්ෂාත් කරගනු ලැබේ. එමෙන්ම, අභ්‍යන්තර විගණන අංශය අවංකව හා වගවීමෙන් කටයුතු කරමින් සහ ස්වාධීනව උපදෙස් ලබාදෙමින් ආයතනයේ අධ්‍යක්ෂවරුන්ට සහ ජ්‍යෙෂ්ඨ කළමනාකරුවන්ට වටිනාකමක් ලබා දෙනු ඇත.

## 8. අධ්‍යක්ෂවරුන්ගේ /අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම්

අවසානයේදී, මෙම ප්‍රතිපත්තිය සමාලෝචනය කර අනුමත කිරීම පැෆ්රල් සංවිධානයේ අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම වේ. පැෆ්රල් සංවිධානය වංචා සහ මූල්‍ය අපරාධ පිළිබඳ නීතියට අනුකූලව ක්‍රියා කරන බවට සහ පැෆ්රල් අරමුදල් හෝ වත්කම් අනිසි ලෙස භාවිත කිරීම වැළැක්වීමට අවශ්‍ය සියලු සාධාරණ පියවර ගන්නා බවට ඔවුන් සහතික විය යුතුය.